**බස්නාහිර පළාත් සභාව - 2017**

**------------------------------**

බස්නාහිර පළාත් සභාවේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පළාත් සභා පනතේ 23(2) වගන්තිය ප්‍රකාර මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**---------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**--------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාක්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් පළාත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 <u>තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම</u>

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. <u>මූල්‍ය ප්‍රකාශන</u>

## 2.1 <u>තත්ත්වාගණනය කළ මතය</u>

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට බස්නාහිර පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 පළාත් සභා අරමුදල

සමාලෝචිත වර්ෂයේ පළාත් සභා අරමුදල් ගිණුම 2018 මාර්තු 09 දින විගණනයට ඉදිරිපත් කරන ලදී.

### 2.2.2 අනෙකුත් ගිණුම්

2018 ජූලි 15 දිනට පළාත් සභාවේ අනෙකුත් ගිණුම් ඉදිරිපත් කිරීමේ තත්ත්වය පහත දැක්වේ.

| | | 2017 වර්ෂයට අදාලව | |
|---|---|---|---|
| | | මුළු ගිණුම් සංඛ්‍යාව | ඉදිරිපත් කළ ගිණුම් සංඛ්‍යාව |
| (i) | විසර්ජන ගිණුම් | 27 | 27 |
| (ii) | ආදායම් ගිණුම් | 30 | 30 |
| (iii) | පළාත් සභා නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් | 27 | 27 |
| (iv) | වානිජ අත්තිකාරම් ගිණුම් | 02 | 02 |
| (v) | වෙනත් අත්තිකාරම් ගිණුම් | 05 | 05 |

| | | | |
|---|---|---|---|
| (vi) | අරමුදල් ගිණුම් | 07 | 07 |
| (vii) | ප්‍රඥප්ති ගිණුම් | 09 | 09 |
| | එකතුව | 107 | 107 |

### 2.2.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා අදාල කරගෙන තිබූ ගිණුම්කරණ ප්‍රතිපත්ති අනුව හිඟ ආදායම් පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කිරීම් කර නොතිබුණි. එහෙත් ආදායම් ගිණුම් අනුව වටිනාකම රු.2,596,501,783 ක හිඟ ආදායම් පැවතුණි.

### 2.2.4 ස්ථාවර වත්කම් ගිණුම්ගත නොකිරීම

පළාත් සභාව විසින් ඉදිරිපත් කර තිබූ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ස්ථාවර වත්කම් දක්වා නොතිබූ අතර එවැනි වත්කම් ඇති බවට මූල්‍ය ප්‍රකාශන සටහන්වලින්ද හෙළිදරව් කර නොතිබුණි. විගණනයට ඉදිරිපත් කරන ලද විසර්ජන ගිණුම්වල වූ ජංගම නොවන වත්කම් සංචලන වාර්තා අනුව සමාලෝචිත වර්ෂය අවසානයට වටිනාකම රු.7,331,920,643 ක ස්ථාවර වත්කම් පළාත් සභාව සතුව තිබූ බව තහවුරු වුණි.

### 2.2.5 ප්‍රතිපාදන කළමනාකරණය

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) පළාත් සභා අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වැය ශීර්ෂ 11 ක අවස්ථා 19 ක් යටතේ ඇස්තමේන්තු කර තිබූ රු.209,011,000 ක්වූ සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරිව තිබුණි.

(ආ) වැය ශීර්ෂ 22 ක අවස්ථා 71 කට අදාලව පුනරාවර්තන ප්‍රතිපාදනවලින් සියයට 50 ට වඩා වැඩි ඉතිරිවීම් රු.4,213,047,292 ක් විය.

(ඇ) පළාත් සභා නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් විෂයයන් 14 කට අදාලව වර්ෂයේ උපරිම වියදම් සීමාවල එකතුව රු.1,054,329,000 ක්වූ අතර එයින් සියයට 10 ත් 77 ත් අතර පරාසයක එකතු වටිනාකම රු.349,595,077 ක් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. ඒ අනුව ඇස්තමේන්තුගත උපරිම සීමා තාත්වික නොවීය.

(ඈ) පළාත් සභා මන්ත්‍රීවරුන්ට වාහන ලබාදීමේදී ලබාදෙන ණය පිළිබඳ 10104 අත්තිකාරම් ගිණුමට අදාලව රු.3,000,000 ක උපරිම වියදම් සීමාවක් පනවාගෙන තිබුණද එයින් ප්‍රයෝජනයට ගෙන තිබුණේ රු.109,006 ක් ලෙස සියයට 3.6 ක් පමණි. ඒ අනුව ඇස්තමේන්තුගත උපරිම වියදම් සීමාව තාත්වික නොවීය.

**2.2.6 නොසැසඳූ පාලන ගිණුම්**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුමේ අග්‍රිම ගිණුම් පිළිබඳ සාරාංශ වාර්තාව අනුව සමාලෝචිත වර්ෂය ආරම්භයේ පළාත් සභාවේ රු.606,458,988 ක නොසැසඳූ ශේෂයක් විය.

(ආ) පළාත් පාලන දෙපාර්තමේන්තුවට අදාලව විසර්ජන ගිණුමේ අත්තිකාරම් ගිණුම් සහ තැන්පත් ගිණුම් සඳහා වූ පාලන ගිණුම්වල සාරාංශ වාර්තාවේ දැක්වෙන පොදු තැන්පත්වල හා අරමුදල් ගිණුමේ දැක්වෙන පොදු තැන්පත්වල සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂයෙහි රු.6,121,458 ක වෙනසක් පැවතුණි.

**2.2.7 අග්‍රිම ගිණුම**

පළාත් භාණ්ඩාගාර පොත් අනුව සමාලෝචිත වර්ෂය අවසානයට සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට අදාලව නිරවුල් නොකළ අග්‍රිම ශේෂය එකතුව රු.758,868,879 ක් විය.

**2.2.8 අත්තිකාරම් ගිණුම්**

පළාත් සභා නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් 27 කට අදාලව සමාලෝචිත වර්ෂය අවසානයට පැවති ණය ශේෂවල එකතුව රු.297,985,694 ක් විය. එයින් වර්ෂයකට වැඩි කාලයක සිට අයනොවී පවතින ශේෂවල එකතුව රු.219,550,576 ක් විය.

**2.2.9 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

ආයතන 04 කට අදාලව හඳුනාගත් කල් ඉකුත්වූ තැන්පත් ශේෂය රු.8,876,031 ක් විය.

**2.2.10 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 2018 ජූලි 16 දිනැති අංක 03/2018 දරන ජාතික අයවැය චක්‍රලේඛය | මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ ලබාගත් වාහන කිලෝමීටර 3,000 ක මාසික අවමයක් ධාවනය කළ යුතු වුවත් පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ වාහන 05 ක් මාස 06 කදී |

| | | |
|---|---|---|
| | | කිලෝමීටර 23,882 ක් හා සමූපකාර සංවර්ධන දෙපාර්මේන්තුවේ වාහනයක් මාස 06 කදී කිලෝමීටර 13,517 ක් ධාවනය කර නොතිබීමෙන් රජයට සිදුවූ පාඩුව පිළිවෙලින් රු.1,187,859 ක් හා රු.741,182 ක් විය. |
| (ආ) | අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ 2015 ජනවාරි 29 දිනැති අංක 05/2015 දරන චක්‍රලේඛය | නිට්ටඹුව සංඝබෝධි විද්‍යාලයේ සිසුන්ගෙන් හා දෙමාපියන්ගෙන් 2017 වර්ෂය තුල රු.1,489,890 ක් එකතු කර එයින් රු.300,000 ක් පාසැල් සංවර්ධන සමිතිය වෙත බැර කර ඉතිරි රු.1,189,890 ක් චක්‍රලේඛයට පටහැනි ලෙස වැය කර තිබුණි. |
| (ඇ) | 2016 ජූලි 05 දිනැති අංක 12/2016 දරන බස්නාහිර පළාත් සභා මූල්‍ය චක්‍රලේඛයේ 04 ඡේදය | සංචිත වාහන සඳහා කාර් රථ නොයෙදිය යුතු වුවත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ මිලදීගත් කාර් රථයක් සංචිතයට යොදවා තිබුණි. |
| (ඈ) | බස්නාහිර පළාත් මූල්‍ය රීති | |
| | (i) රීති 283.4 | පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයට අදාල බැංකු ගිණුමකින් නිකුත් කළ නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොකළ මාස 06 ඉක්මවූ රු.407,120 ක් වටිනා චෙක්පත් 81 ක් සම්බන්ධව කටයුතු කර නොතිබුණි. |
| | (ii) රීති 560 | අධ්‍යාපන අමාත්‍යාංශයට අදාල ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබූ අතර මීරිගම මූලික රෝහලට අදාලව ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |

## 03. ආදායම් කළමනාකරණය

### 3.1 ඇස්තමේන්තුගත ආදායම හා තථ්‍ය ආදායම

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 කට අදාල පළාත් සභාවේ ඇස්තමේන්තුගත ආදායම හා තථ්‍ය ආදායම පහත පරිදි විය.

| වර්ෂය | ඇස්තමේන්තුගත ආදායම | | තථ්‍ය ආදායම | |
|---|---|---|---|---|
| | බදු ආදායම | බදු නොවන ආදායම | බදු ආදායම | බදු නොවන ආදායම |
| | රු.මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| 2017 | 39,661 | 3,318 | 40,544 | 3,954 |
| 2016 | 35,544 | 2,921 | 37,394 | 3,809 |
| 2015 | 33,130 | 2,760 | 31,540 | 3,269 |
| 2014 | 28,285 | 2,992 | 28,113 | 2,979 |
| 2013 | 27,302 | 2,815 | 22,262 | 3,259 |

### 3.2 ආදායම් සංකේත අංක 10-03-07-10

ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 කට අදාලව පුද්ගලයින් / ආයතන 15 කින් 2017 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු උකස් බලපත්‍ර ගාස්තු රු.235,768 ක් විය.

### 3.3 ආදායම් සංකේත අංක 20-02-01-01

ප්‍රධාන ලේකම් කාර්යාලයට හා වලල්ලාවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාලව වර්ෂ 03 කට වැඩි කාලයක සිට පවතින හිඟ ගොඩනැගිලි බදු කුලී එකතු වටිනාකම රු.515,550 ක් විය.

### 3.4 ආදායම් සංකේත අංක 10.02.04.03

ජාඇල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පුද්ගලයෙකුට අයත් රා තැබෑරුම් බලපත්‍ර 02 කට අදාලව 2014 හා ඊට පෙර වර්ෂ සඳහා රු.773,153 ක හිඟ ආදායමක් පැවතුණි.

### 3.5 ආදායම් සංකේත අංක 10.02.04.05

ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 කට අදාල ආයතන 12 කින් 2017 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු සුරාබදු බලපත්‍ර ගාස්තු රු.1,230,000 ක් විය.

**3.6 ආදායම් සංකේත අංක 20-02-01-03**

(අ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 12 කට අයත් ආයතන 207 කින් 2017 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු දීර්ඝකාලීන ඉඩම් බදු රු.16,979,455 ක් විය.

(ආ) රාගම ජල සම්පාදන යෝජනා ක්‍රමයේ හෙක්ටයාර් 0.4225 ක ඉඩම වර්ෂ 11 ක කාලයක සිට ජාතික ජල සම්පාදන හා ජලපවාහන මණ්ඩලය විසින් භුක්ති විඳින නමුත් පළාත් සභාවට කිසිදු බදු ආදායමක් ලැබී නොතිබුණි.

(ඇ) වත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් අංක 171 බී බලගල ග්‍රාම නිලධාරී වසමේ දික්ඕවිට ගමේ අක්කර 4 රූඩ් 1 පර්චස් 18 ක් (පර්චස් 698) පමණ වූ රජයේ ඉඩම් කොටසක් පුද්ගලික පාර්ශවයකට 1997 ජූලි 31 දින කෘෂිකාර්මික කටයුත්තක් සඳහා බදුදී තිබුණි. නිරීක්ෂණ පහත දැක්වේ.

(i) කොන්දේසිගත වාර්ෂික බදු මුදල වූ රු.140,000 ක් 1995 වර්ෂයේ සිට අයනොවීම හේතුවෙන් රු.6,830,950 ක පාඩුවක් රජයට සිදුව තිබුණි.

(ii) අදාල ඉඩම වානිජ කටයුතු සඳහා යොදා ගන්නා බව අනාවරණයවීම නිසා බදු ගිවිසුම අත්හිටුවන ලෙස 2002 ජුනි මාසයේදී ප්‍රාදේශීය ලේකම්ට නියෝග කර තිබුණද එම නියෝගය ක්‍රියාත්මක කර නොතිබුණි. 2005 වර්ෂයේදී බදුකාරිණිය මෙම ඉඩමෙන් පර්චස් 550 ක් වර්ෂ 10 කට අතුරු බදුදී තිබූ අතර ඉතිරි පර්චස් 148 හි නිවාස 03 ක් ඉදිකර නේවාසික භුක්තිය ලබාදෙන ලෙස ඉල්ලා තිබුණද මෙම ඉඩම් ගැටළුව නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 04. මූල්‍ය සමාලෝචනය

### 4.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පළාත් සභා අරමුදලේ රු.401,630,872 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.3,597,241,876 ක් විය.

### 4.2 මූල්‍ය පාලනය

සභාවේ අතිරික්ත මුදල් කෙටිකාලීන ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබූ අතර එම ආයෝජනය සමාලෝචිත වර්ෂය අවසානයට රු.6,750,000,000 ක් විය. මීට අමතරව සභාවේ අධිකාරි හා වෙනත් අරමුදල් 09 ක සමාලෝචිත වර්ෂය අවසානයට පැවති ආයෝජනවල වටිනාකම රු.830,529,498 ක් විය.

**4.3 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාල අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම් අදාල විචලනයන් සමඟ පහත දැක්වේ.

| | 2017 | | | 2016 | | |
|---|---|---|---|---|---|---|
| | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය |
| **ආදායම්** | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| බදු ආදායම් | 39,661 | 40,544 | 883 | 35,544 | 37,394 | 1,850 |
| බදු නොවන ආදායම් | 3,318 | 3,954 | 636 | 2,921 | 3,809 | 888 |
| රජයේ ප්‍රදාන හා ඉතිරිවීම් | 22,406 | 18,085 | (4,321) | 36,930 | 24,102 | (12,828) |
| එකතුව | **65,385** | **62,583** | **(2,802)** | **75,395** | **65,305** | **(10,090)** |
| **වියදම්** | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 34,051 | 33,929 | 122 | 36,722 | 34,038 | 2,684 |
| අනෙකුත් | 20,336 | 18,722 | 1,614 | 23,754 | 20,287 | 3,467 |
| පුනරාවර්තන | **54,387** | **52,651** | **1,736** | **60,476** | **54,325** | **6,151** |
| ප්‍රාග්ධන | 14,748 | 9,530 | 5,218 | 14,918 | 7,382 | 7,536 |
| එකතුව | **69,135** | **62,181** | **6,954** | **75,394** | **61,707** | **13,687** |

සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන හා ප්‍රාග්ධන වැය අතර අනුපාතය 6 : 1 ක් විය.

**05. ප්‍රඥප්ති ගිණුම් හා අරමුදල් ගිණුම්**

**5.1 ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශය**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) කම්කරු නීතිරීතිවලට අනුව සේවකයෙකුගේ සේවා කාලය අඛණ්ඩව පැය 24ක් ලබාගන්නේ නම් ඉන් පසුව එම සේවකයාට විවේක කාලයක් ලබාදිය යුතු වුවත් නියැදි පරීක්ෂාවට ලක්කළ 2017 නොවැම්බර් මාසයේදී අඛණ්ඩව මාසය පුරා ආරක්ෂක නිලධාරියෙකුගේ සේවය ලබාගෙන ගෙවීම් කර තිබුණි. මේ නිසා ඉහළ ගුණත්වයෙන් යුතු ආරක්ෂක සේවාවක් ලබාගැනීමේ, ආයතනයේ අරමුණ ඉටුවේද යන්න ගැටළු සහගත විය.

(ආ) වෙස්ප්‍රෝ ආරක්ෂක සේවාවේ ප්‍රධාන විධායක නිලධාරී වෙත වැටුප් හා දීමනාවලට අමතරව උපදේශන සේවාවන් සැපයීම වෙනුවෙන් රු.210,000 ක් සමාලෝචිත වර්ෂය තුළ ගෙවා තිබුණි.

(ඈ) 1999 පෙබරවාරි 26 දිනැති අංක 02/99 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව කැබිනට් අමාත්‍යාංශ ලේකම්වරුන්ට පමණක් ජංගම දුරකථන සැපයීමට අනුමත කර තිබියදී ඊට පටහැනිව කාර්යාංශයේ සේවයේ නියුතු නිලධාරීන්ට රු.543,810 ක් වටිනා ජංගම දුරකථන 04 ක් ලබාදී තිබුණි.

(ඈ) කාර්යාංශයට අයත් වාහන සංඛ්‍යාව 04 ක් සඳහා නඩත්තු වියදම වර්ෂයකට රු. මිලියන 01 කට වැඩි වටිනාකමක් ගෙන තිබුණි. පසුගිය වර්ෂ 05 ක් තුළ වාහන නඩත්තු වියදම රු.7,021,485 ක් විය.

(ඉ) කාර්යාංශය යටතේ ක්‍රියාත්මකව පැවති ඉන්ටර්ලොක් ගල් ඇතුරුම් ව්‍යාපෘතියට අදාලව රු.1,552,414 ක ණයගැති ශේෂ 04 ක් 2014 වර්ෂයේ සිට මේ දක්වාම පැවතුණි.

(ඊ) කාර්යාංශ ප්‍රඥප්තියේ 19(1) වගන්තිය ප්‍රකාර ප්‍රඥප්තියේ සඳහන් විධිවිධාන ක්‍රියාත්මක කිරීමට, බලාත්මක කිරීමට හා ගාස්තු අයකිරීමට අදාල රීති පනවා නොතිබුණි.

(උ) ඉකුත් වර්ෂයේ ලැබුණු ප්‍රාග්ධන ප්‍රදානවලින් වර්ෂය අවසානය වනවිට රු.26,442,557 ක් උපයෝජනය කර නොතිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට වැය නොකළ ප්‍රාග්ධන ප්‍රදාන රු.8,769,154 ක් විය.

(ඌ) 2017 දෙසැම්බර් 31 දිනට ආයතනය සතු ජංගම ගිණුම්වල රු.21,029,155 ක් රඳවා තිබූ බැවින් ඵලදායි ආයෝජනයක යෙදවීමෙන් ලබාගත හැකිව තිබූ සැලකිය යුතු පොලී ආදායමක් අහිමිවී තිබුණි.

## 5.2 අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) අධිකාරියෙන් වැටුප් ගෙවන නීති නිලධාරියෙකු සිටියදී නීති ගාස්තු ලෙස 2016 හා 2017 වර්ෂවල පිළිවෙලින් රු.701,328 ක් හා රු.1,252,184 ක් පෞද්ගලික නීතිඥයකුට ගෙවා තිබුණි.

(ආ) වර්ෂ 5කට අධික කාලයක සිට අය නොවී පවතින රු.35,790,333 ක් වටිනා ණය ගැති ශේෂයන් 14 ක් මූල්‍ය ප්‍රකාශ වල දක්වා තිබූ අතර එම ශේෂයන් අයකර ගැනීමට අධිකාරිය ක්‍රියාකර නොතිබුණි.

**5.3 පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය**

**5.3.1 කොන්ත්‍රාත්කරුවන්ට තාර නිකුත් කිරීම**

ව්‍යාපෘතිවලින් අඩුකර ගැනීමේ පදනම මත 2012 – 2014 දක්වා අධිකාරිය විසින් පිරිවැය රු.1,855,935,254 ක් ලෙස ගණනය කරන ලද තාර කොන්ත්‍රාත්කරුවන් 16 දෙනෙකු වෙත බෙදා හැර තිබිණි. එක් එක් කොන්ත්‍රාත්කරුවන්ට තාර ලබා දීමේදී කිසිදු ගිවිසුමක් හෝ අත්තිකාරම් බැඳුම්කරයක් ලබාගෙන නොතිබූ අතර ඒ පිළිබඳ පාලන ගිණුමක් හෝ ලේඛනයක් හෝ නොතිබුණි. 2018 අප්‍රේල් 10 දින වන විට කොන්ත්‍රාත්කරුවන් 05 දෙනෙකුගෙන් අයවිය යුතු තාරවල වටිනාකම රු.30,668,810 ක්වූ අතර එහි කොන්ත්‍රාත්කරුවන් දෙදෙනෙකුගෙන් පමණක් රු.30,597,427 ක් අයවිය යුතුව තිබුණි.මේ වන විට ව්‍යාපෘති ක්‍රියාත්මක වීම අඩුවී තිබීම හා තාර නිකුත්කළ කොන්ත්‍රාත්කරුවන්ට අළුතින් ව්‍යාපෘති පිරි නොනැමීමේ තත්ත්වය හමුවේ මෙම තාරවල මුදල් අයකර ගැනීමේ අවදානමක් පැවතුණි.

**5.3.2 පළාත් සභාවෙන් බැහැර ව්‍යාපෘති**

(අ) ව්‍යාපෘති බලධාරියා හෝ ක්‍රියාත්මක කිරීමේ බලධාරියා පළාත් සභාවෙන් බැහැර ආයතන වෙත සේවා සැලසීමේදී හෝ අධීක්ෂණ කටයුතු කිරීමේදී පළාත් මූල්‍ය රීති 429.3 ප්‍රකාරව ඇස්තමේන්තුගත මුදලින් සියයට 5 ක් පළාත් සභා අරමුදලට බැරකළ යුතු වුවත් 2016 හා 2017 වර්ෂවලට අදාල ව්‍යාපෘති මුදල වූ පිළිවෙලින් රු.2,327,913,340 ක් හා රු.1,798,170,038 ක් සඳහා සියයට 5 ක් වන පිළිවෙලින් රු.116,395,667 ක් හා රු.89,908,501 ක් පළාත් සභා අරමුදලට බැරකර නොතිබුණි.

(ආ) පළාත් මූල්‍ය රීති 429.4(අ) ප්‍රකාරව බාහිර ව්‍යාපෘති වෙනුවෙන් තක්සේරු කළ මුළු පිරිවැය සම්පූර්ණයෙන්ම කලින් තැන්පත් කරන තෙක් කිසිදු වැඩක් භාර නොගත යුතු අතර මුදල් කොටස් වශයෙන් ගෙවීමකට හෝ කිසියම් වෙනස් කිරීමකට ඉල්ලීමක් වෙතොත් එම ඉල්ලීමට ප්‍රධාන ලේකම්ගේ අනුමැතිය ලබාගත යුතු විය. එහෙත් අධිකාරියේ බාහිර ව්‍යාපෘති 04 කට අදාලව රු.2,327,913,340 ඇස්තමේන්තුගත මුදලින් සියයට 50 කට වැඩි ප්‍රමාණයක් වෙනුවෙන් එවැනි අනුමැතියක් ලබාගෙන නොතිබුණි.

**5.3.3 හිඟ ආදායම්**

පළාත් මූල්‍ය රීති 116.1 අනුව නීති මාර්ගයෙන් හෝ වෙනත් මාර්ගවලින් හෝ හිඟ අයකර ගැනීමට කටයුතු නොකිරීම නිසා 2013 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා මුළු හිඟ ආදායම් රු.45,847,241 ක් වී තිබුණි.

**5.3.4 මාර්ග සංවර්ධන අරමුදල**

2013 අගෝස්තු 01 දිනැති පළාත් රාජ්‍ය ගිණුම්කාරක සභා නියෝගය පරිදි පත්කළ කමිටුව විසින් ලබාදී ඇති නිර්දේශ අනුව අරමුදල් ගිණුම්වල අතිරික්තව ඇති මුදල් ප්‍රාග්ධන සංචිත නමින් ගිණුමක් ඇති කර එම ගිණුමට මාරුකළ යුතු විය. එහෙත් අරමුදල් අතිරික්තය උපයෝගී කරගෙන රු.182,465,000 ක ඇස්තමේන්තුගත මුදලකින් අළුතින් ව්‍යාපෘති 41 ක් 2015 වර්ෂයේ ආරම්භ කර ගිණුමේ ඉතිරි මුදලින් රු.370,171,428 ක් 2016 වර්ෂයේදී ප්‍රාග්ධන සංචිතයට මාරුකර තිබුණි. මෙහිදී වෙනත් මූලාශ්‍රවලින් ලැබුණු රු.1,157,625,144 ක් 2016 වර්ෂය තුළදී ප්‍රාග්ධන සංචිත ගිණුමට මාරුකර තිබීම නිසා ව්‍යාපෘතිවලින් ඉපයූ ලාභය ආදායම් වියදම් ගිණුමින් ඉවත් වී තිබීමෙන් අනාගතයේදී ආදායම් බදු සඳහා උපයෝගී කරගන්නා ලාභයද ඉවත්වී තිබුණි.

**5.3.5 තාර සැපයීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය**

හොරණ (වගවත්ත) ඇස්පෝල්ට් නිෂ්පාදනාගාරය සඳහා 60/70 ශ්‍රේණියේ තාර මෙට්‍රික් ටොන් 1000 ක් (කිලෝග්‍රෑම්1,000,000) ලීටර් 01 / කිලෝග්‍රෑම් 01 ක් රු.49.48 ක මිලකට මිලදී ගැනීම සඳහා පුද්ගලික සමාගමක් සමග 2016 නොවැම්බර් 22 දින ගිවිසුම්ගත වී තිබූ අතර සැපයුම් කාල සීමාව 2016 නොවැම්බර් 15 දින සිට 2017 අප්‍රේල් 15 දින දක්වා විය. පසුව 2017 මැයි 15 දින දක්වා ඒකකයක් රු.52.48 බැගින් සංශෝධනය කර තිබුණි. මේ සම්බන්ධව පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2016 නොවැම්බර් 21 දින සිට 2017 ජනවාරි 06 දින දක්වා මෙම ප්‍රසම්පාදනයට අදාලව තාර කිලෝග්‍රෑම් 423.23 ක් සපයා තිබියදී 2017 ජනවාරි 10 දින එම සමාගම විසින් තාර සැපයීමට නොහැකි බව දන්වා තිබුණද 2017 ජූනි 19 දින දක්වා වලංගුව පැවති රු.4,948,000 වටිනා කාර්යසාධන බැඳුම්කරය මුදල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ගිවිසුම් ප්‍රකාරව කටයුතු නොකිරීම සම්බන්ධව මෙම ආයතනය අසාදු ලේඛනගත කිරීමද සිදුකර නොතිබුණි.

(ඇ) සියළුම ගෙවීම් කොමර්ෂල් බැංකුවෙහි ඇති ගිණුම හරහා කළ යුතු බවට සඳහන් කොන්දේසි සහිත කොමර්ෂල් බැංකුවෙන් නිකුත් කළ කාර්යසාධන බැඳුම්කරයක් ලබාගෙන තිබීම නිසා එම කාර්යසාධන බැඳුම්කරය මුදල් කරගැනීමේ අවදානමක් පැවතුණි.

(ඇ) මීට පෙර ඉදිරිපත් කළ සියළුම ටෙන්ඩර් කොන්දේසිවල ලංකා ඛණිජ තෙල් සංස්ථාවේ මිල ගණන් විචලනය වන ලංසු මිලට එම මිල ගැලපීම සිදුකරනු ලබන බවට වගන්තියක් ඇතුළත්කර තිබුණද මෙම ටෙන්ඩරයට පමණක් ගිවිසුම් කාලය තුළ ගිවිසුම්ගත ද්‍රව්‍ය ප්‍රමාණය අනුමත ස්ථාවර මිල මත සැපයීම කළ යුතුය යන වගන්තිය ඇතුළත් කර තිබුණි. මේ අනුව ඛණිජ තෙල් සංස්ථාවේ තොග ලැබීම මත හෝ වෙළදපලට තාර ලැබීම මත අඩු මිලට තාර ලබාගැනීමට නොහැකි වී තිබුණි.

### 5.3.6 වාහන පාලනය

----------------

අධිකාරියට අයත් මෝටර් රථ 07 කට නව එන්ජින් තබා අළුත්වැඩියා කර තිබූ නමුත් නව එන්ජින් අංක මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ලවා ලියාපදිංචි සහතිකවල ඇතුළත් කරගෙන නොතිබුණි.

### 5.3.7 පරිහරණ අයිතිය නැතිවී ඇති ඉඩම්

------------------------------------

භුක්තිය පමණක් හිමි ඉඩම් 10 ක මුළු භූමි ප්‍රමාණය අක්කර 10 රූඩ් 01 හා පර්චස් 23.71 ක්වූ ප්‍රදේශයක නෛතික හිමිකාරීත්වයක් නොමැති පුද්ගලයින් දීර්ඝකාලීනව පදිංචිවී ඇති අතර අධිකාරියේ කළමනාකාරීත්වය විසින් ඉඩම් නිරවුල් කරගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග නොගැනීම නිසා එහි පරිහරණ අයිතිය අධිකාරියට අහිමිවී තිබුණි.

## 5.4 මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය

----------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය විසින් 2016 ඔක්තෝබර් 06 දින රජයේ පුවත්පත් වල පල කරන ලද දැන්වීමක් මඟින් බස්නාහිර පළාතේ මාර්ග 136 ක් වෙනුවෙන් මාර්ග බලපත්‍ර ලබාදීමට මිල ගණන් කැඳවා තිබුණු අතර බස්රථ හිමියන් 288 දෙනෙකු විසින් මිල ගණන් ඉදිරිපත් කර තිබුණි. මිල ගණන් ඉදිරිපත් කල 171 දෙනෙකුට මාර්ග බලපත්‍ර ලබාදීමට ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කර තිබූ අතර ඉන් 95 දෙනෙකු බලපත්‍ර ලබාගැනිමට ඉදිරිපත් වී තිබුණි. එහෙත් මිල ගණන් ඉදිරිපත් කළ බස්රථ හිමියන් සිටියදී ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව ලංසු වටිනාකමට සියයට 10 ක අධිභාරයක් එකතු කරමින් බස්රථ හිමියන් 31 දෙනෙකුට බලපත්‍ර ලබා දීමට කටයුතු කර තබුණි.

(ආ) 2013 වර්ෂයේ දෙල්ගොඩ බස් නැවතුම්පල හා කඩ කාමර 13 ක් රු.32,292,635 ක් වැයකර ඉදිකිරීම් අවසන් කර තිබුණද 2018 පෙබරවාරි වනවිටත් එම කඩකාමර කුලියට දී නොතිබුණි.

**5.5 කෘෂි සේවා අධිකාරිය**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් ලැබෙන අක් මුදල් අධිකාරියේ ප්‍රධාන ලැබීම් මූලාශ්‍රය වන අතර ඒ යටතේ ලද මුදල් වලින් සමාලෝචිත වර්ෂය අවසානය වනවිට රු.5,642,440 ක් අධිකාරියේ බැංකු ගිණුමේ නිශ්කාර්යව පැවතුණි.

(ආ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් අනුමත කර තිබූ කාර්ය මණ්ඩලය තනතුරු 19 ක්වූ අතර දැනට ස්ථිර කාර්ය මණ්ඩලය 07 ක් හා කොන්ත්‍රාත් පදනමින් බඳවාගත් කාර්ය මණ්ඩලය 03 ක් විය. කාර්ය මණ්ඩල පුරප්පාඩු 09 ක් සම්පූර්ණ කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2015 වර්ෂයේ N 58222962047 "විද්‍යුත් කෘෂිකර්මය ප්‍රවේශය හඳුන්වාදීම සඳහා අවශ්‍ය අනුශාංගික ක්‍රියාකාරකම් සිදුකිරීම" යන ව්‍යාපෘතිය වෙනුවෙන් රු.500,000 ක් වැයකර ඇති නමුත් විද්‍යුත් කෘෂිකර්මය පිළිබඳ හඳුන්වාදීමක් 2017 වර්ෂය වනවිටත් සිදුකර නොතිබුණි.

**06. මෙහෙයුම් සමාලෝචනය**

**6.1 කාර්ය සාධනය**

**6.1.1 රජයේ ප්‍රදාන**

සමාලෝචිත වර්ෂයට අදාලව පළාතේ සංවර්ධන කාර්යයන් සඳහා ලැබී තිබූ රජයේ ප්‍රදාන හා ඒවා උපයෝජනය පහත පරිදි විය.

| | මූලාශ්‍රය | අනුමත මුදල | වැය කළ මුදල | ඌන උපයෝජනය |
|---|---|---|---|---|
| | | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| (i) | පළාත් නිශ්චිත කාර්ය ප්‍රදාන (PSDG) | 692.40 | 618.13 | 74.27 |
| (ii) | පළාත් සංවර්ධන ප්‍රදාන (PDG) | 1,365.88 | 1,285.51 | 80.37 |
| (iii) | උපමාන පාදක ප්‍රා.ලේ. කොට්ඨාශ වැඩසටහන (CBG) | 259.14 | 247.36 | 11.78 |
| (iv) | විශේෂ අංශ සංවර්ධන ප්‍රදාන - සෞඛ්‍ය (HSDP) | 414.73 | 390.43 | 24.30 |
| (v) | විශේෂ අංශ සංවර්ධන ප්‍රදාන - අධ්‍යාපන (TSEP) | 135.46 | 135.38 | 0.08 |
| | එකතුව | 2867.61 | 2676.81 | 190.80 |

**6.1.2 පළාත් සංවර්ධන සැලැස්ම**

සමාලෝචිත වර්ෂය සඳහා වූ පළාත් සංවර්ධන සැලැස්ම යටතේ වූ ව්‍යාපෘති වෙනුවෙන් රු.මිලියන 5,147.23 ක ඇස්තමේන්තු වටිනාකමකට වූ යෝජනා 8,830 ක් අනුමත කර තිබුණි. පළාත් සභාවේ ප්‍රගති වාර්තා අනුව වැඩ යෝජනාවල ප්‍රගතිය පහත පරිදි විය.

| | විස්තරය | ව්‍යාපෘති යෝජනා ගණන | මුළු වැඩවල ඇස්තමේන්තු වටිනාකම |
|---|---|---|---|
| | | | රු. මිලියන |
| (i) | සම්පූර්ණයෙන් නිම කළ | 8,504 | 4,831.77 |
| (ii) | සියයට 50 කට වඩා අඩුවෙන් නිම කළ | 57 | 128.11 |
| (iii) | සියයට 50 කට වඩා වැඩියෙන් නිම කළ | 25 | 69.28 |
| (iv) | ආරම්භ කර නොතිබූ | 200 | 106.23 |
| (v) | මතභේදයට තුඩුදෙන / ප්‍රශ්නකාරී තත්ත්වයන් යටතේ වූ | 44 | 11.84 |
| | එකතුව | 8,830 | 5,147.23 |

**6.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) මහරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් දීර්ඝකාලීන බදු ගිවිසුම් 139 ක් වෙනුවෙන් ගිවිසුම් ගතවී තිබූ නමුත් බාලදක්ෂ මූලස්ථානය සඳහා පමණක් බදුකරයක් නිකුත් කර තිබුණි.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට බස්නාහිර පළාතේ මුළු සමුපකාර සමිති ගණන 1,414 ක්වූ අතර එයින් සමිති 94 ක් හෙවත් සියයට 07 ක් අක්‍රිය සමිති විය. සමාලෝචිත වර්ෂය අවසානයට පැවති අක්‍රිය සමිති සක්‍රිය කිරීමට විධිමත් සැලැස්මක් සකස් කර නොතිබුණි.

(ඇ) නැවත සේවයේ පිහිටුවීමේ අභියාචනා හා විනය නියෝගවලට එරෙහි අභියාචනා සඳහා පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ලැබිය යුතු වාර්තා හා ලේඛන නොලැබීම මත අභියාචනා 41 ක් විසඳීමට නොහැකිව පැවතුණි.

(ඈ) පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරීන් දෙදෙනෙකු සඳහා නිල වාහන 02 ක් මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ ඉල්ලුම් කර නැවත ප්‍රතික්ෂේප කිරීම නිසා මෙම වාහන සංචිතයේ භාවිතයට යෙදවීමට සිදුවීමෙන් රු.2,010,660 ක වියදමක් දැරීමට සිදුව තිබුණි.

(ඉ) අධ්‍යාපන අමාත්‍යාංශයේ අංක N 77582864004 දරන "කොළඹ දිස්ත්‍රික්කයේ ලියාපදිංචි ක්‍රීඩා සමාජ සඳහා අවශ්‍ය ක්‍රීඩා උපකරණ ලබාදීම" ව්‍යාපෘතියට අදාල ක්‍රීඩා භාණ්ඩ මිලදී ගැනීම සඳහා රු.2,989,600 ක් 2017 වර්ෂයේ වැයකර තිබූ නමුත් 2018 ජනවාරි වනවිටත් අදාල ක්‍රීඩා භාණ්ඩ ගබඩාව වෙත ලැබී නොතිබුණි.

(ඊ) සමූපකාර සංවර්ධන දෙපාර්මේන්තුවේ ප්‍රාදේශීය කාර්යාල 03 ක් සඳහා රු.150,000 ක උපරිමයකට යටත්ව මාසික අතුරු අග්‍රිමයක් නිකුත් කිරීමට ප්‍රධාන ලේකම් විසින් අනුමත කර තිබුණද සමාලෝචිත වර්ෂයේදී රු.300,000 බැගින් අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි.

(උ) මාර්ග අමාත්‍යාංශයේ ග්‍රාම සංවර්ධන ප්‍රඥප්තියේ අරමුණු අනුව ප්‍රාදේශීය බල මණ්ඩල 40 න් 38 කම ප්‍රාදේශීය බල මණ්ඩල පිහිටුවා නොමැතිවීම හේතුවෙන් ගම්පහ, කළුතර හා කොළඹ දිස්ත්‍රික්ක සඳහා දිස්ත්‍රික් බල මණ්ඩල පිහිටුවීමට නොහැකිවී තිබුණි. එබැවින් සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් පළාත් බල මණ්ඩලය හා ග්‍රාම සංවර්ධන අරමුදලක් පිහිටුවා නොතිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂය අවසානයට සමූපකාර සමිතිවලට නිකුත් කළයුතු විගණන වාර්තා 350 ක් සමූපකාර දෙපාර්තමේන්තුවේ රඳවාගෙන තිබූ අතර විගණන වාර්තා ප්‍රමාදවීම හේතුවෙන් සමූපකාර අරමුදලට ලබාදිය යුතු දායකත්ව මුදල තීරණය කිරීමට නොහැකිවී තිබුණි.

(එ) හොරණ කලාප අධ්‍යාපන කාර්යාලය යටතේ පවතින පාසැල් 22 ක ගොඩනැගිලි 22 ක් දීර්ඝ කාලයක් තිස්සේ අවදානම් තත්ත්වයේ පවතින බව 2017 අප්‍රේල් මාසයේදී පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත වාර්තාවී තිබුණද ඒවා ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඒ) බස්නාහිර පළාත් අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය විසින්, සුන්දර ගම්මාන වැඩසටහන යටතේ ගම්පහ දිස්ත්‍රික්කයේ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය සඳහා ඉඩමක් අත්පත් කර ගැනීම වෙනුවෙන් දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් වෙත 2014 දෙසැම්බර් ලබාදුන් රු.1,858,320 ක් පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

(ඔ) ගම්පහ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ විමර්ශන නිම නොවී පැවතීම හේතුවෙන් වර්ෂ 04 සිට වර්ෂ 06 දක්වා කාලයක සිට නිරවුල් නොකරන ලද කර්මාන්ත රඳවුම් මුදල් රු.846,088 ක් විය.

### 6.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-----------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ 2017 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය අනුව ගබඩාවේ පැවති ක්‍රීඩා භාණ්ඩ ශේෂය, ක්‍රීඩා අංශයේ පවත්වාගෙන යනු ලබන ඉන්වෙන්ට්‍රි ලේඛනය සහ ව්‍යාපෘති භාණ්ඩ ලැබීම් හා නිකුත් කිරීම් ලේඛන අනුව පැවති ක්‍රීඩා

භාණ්ඩ ශේෂයන් අතර ඌනතා සහ අතිරික්තතා පැවතුණි. භෞතික පරීක්ෂාවට අනුව ක්‍රීඩා භාණ්ඩ ඌනතාවයේ වටිනාකම රු.3,209,285 ක්වූ අතර ගබඩා ලේඛනවලට ඇතුළත්ව නොතිබූ ක්‍රීඩා භාණ්ඩවල වටිනාකම රු.200,510 ක් විය.

(ආ) මීරිගම මූලික රෝහලේ ඇස්තමේන්තු අනුව ලබාගෙන තිබූ ඖෂධ භාවිතා නොකිරීම හේතුවෙන් රු.139,356 ක්වූ ඖෂධ වර්ග 11 ක් කල් ඉකුත්වී තිබූ අතර මෙම ඖෂධ කල් ඉකුත් වීමට පෙර වෙනත් රෝහල්වලට මාරු කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) කිරිබත්ගොඩ මූලික රෝහලේ සෙල්සියස් අංශක 25 හා 30 ට අඩු උෂ්ණත්වයක රඳවා තබා ගත යුතු ඖෂධ වර්ග 5 ක් පාරිසරික උෂ්ණත්වයේ රඳවා තිබූ අතර රු.222,917 ක් වටිනා කල් ඉකුත් වූ ඖෂධ වර්ග 22 ක් හා 2015 වර්ෂයේ සිට නිකුත් කිරීම අත්හිටවූ රු.207,605 ක් වටිනා ඖෂධ වර්ග 11 ක් ගබඩාවේ රඳවාගෙන තිබුණි.

(ඈ) කිරිබත්ගොඩ මූලික රෝහලේ එක්ස්- කිරණ ඒකකයක් පිහිටුවීම සඳහා 2016 වර්ෂයේ සිට රු.9,632,352 ක් වටිනා උපකරණ මිලදී ගෙන තිබුණද, 2017 දෙසැම්බර් වනවිටත් මෙම ඒකකයේ කටයුතු ආරම්භ කර නොතිබුණි.

(ඉ) මීරිගම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේ ඖෂධ ගබඩාවේ 2017 දෙසැම්බර් කල් ඉකුත් වූ විටමින් A (megadose) පෙති 24,000 ක් හා තත්ත්වයෙන් බාල යකඩ පෙති 189,000 ක් තැන්පත් කර තිබුණි.

**6.4 දූෂ්‍ය අක්‍රමිකතා**

----------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2011 පෙබරවාරි 10 දින හෝ ඊට ආසන්න දිනයක සිට 2013 ජූලි මාසය හෝ ඊට ආසන්න කාලපරිච්ඡේදයක් දක්වා මීනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ලැබුණු නොගෙවන ලද මහජනාධාර මුදල් රු.1,441,440 ක් හෝ ඊට ආසන්න මුදලක් රජයේ ගිණුමෙහි තැන්පත් නොකොට සාවද්‍ය පරිහරණයට යොදා ගැනීම නිසා සිදුවී ඇති මූල්‍ය වංචාව සම්බන්ධයෙන් 2013 වර්ෂයේ සිට අධිකරණ ක්‍රියාමාර්ග පවත්වාගෙන ගියද 2018 පෙබරවාරි වනවිටත් එම කටයුතු නිමවී නොතිබුණි.

(ආ) මහර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පළාත් සභා ආදායම් රු. 915,786 ක් 2014 ජූලි මස අස්ථානගත වී තිබුණු නමුත් 2018 මැයි වනවිටත් වගකිව යුතු පාර්ශව හඳුනාගෙන නොතිබුණි.

**6.5 නිෂ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) අධ්‍යාපන අමාත්‍යාංශය විසින් සංවිධානය කර තිබූ 2017 සැප්තැම්බර් 22 දින පැවති 43 වන ජාතික ක්‍රීඩා උළෙලට සහභාගී වූ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට හා නිලධාරීන්ට බෙදාදීම සඳහා මිලදීගත් සපත්තු කුට්ටම් 673 ක්, ගමන් මළු 556 ක්, නිලධාරීන් වෙනුවෙන් මිලටගෙන තිබූ ටී කමිස (වෙට්ලුක්) 09 ක් හා බොටම් 09 ක්, ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා මිලදීගෙන තිබූ ටී කමිස හා බොටම් 35 ක්, ජැකට් 39 ක් සහ Crocodile වර්ගයේ ටී කමිස 124 ක් 2018 ජනවාරි 27 දින වනවිටත් ගබඩාවේ ඉතිරිව පැවතුණි.

(ආ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 කට අදාල ප්‍රතිලාභීන් වෙත බෙදාදීම සඳහා රු.6,424,578 ක් වැයකර 2017 වර්ෂයේ මිලදීගෙන තිබූ ව්‍යාපෘති භාණ්ඩ 4,801 ක් බෙදාදීමෙන් තොරව නිශ්කාර්යව පැවතුණි.

(ඇ) බස්නාහිර පළාතේ අඩු ආදායම්ලාභී පවුල්වල අධ්‍යාපනය ලබන දරුවන්ට සහන සැලසීම සඳහා පාවහන් යුගලක් ලබාදීමේ වැඩසටහන යටතේ මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභාවේ ප්‍රතිපාදනවලින් රු.189,920 ක් වැය කර නිට්ටඹුව සංඝ බෝධි විද්‍යාලයේ සිසුන් 216 දෙනෙකු සඳහා සපත්තු යුගල 216 ක් 2017 ජනවාරි 31 දින පාසැලට සපයා තිබුණද ඒවා 2017 නොවැම්බර් 15 දින වනවිටත් දරුවන්ට ලබාදී නොතිබුණි. පාවහන් අවශ්‍යතාවය නිසි පරිදි සලකා බැලීමෙන් තොරව මිලදී ගැනීම නිසා පාසලේ භාවිතා නොකරන පාවහන් යුගල 90 ක්ද සපයා තිබුණි.

(ඈ) ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත 2014 වර්ෂයේ රු.2,960,149 ක් වැයකර පිඹුර මූලික රෝහලේ රාජ්‍ය ඔසුසැලක් ඉදිකර 2015 අප්‍රේල් 02 දින භාරදී තිබුණද අවශ්‍ය පිරිවිතරයන්ට නොගැලපීම නිසා 2018 ජනවාරි වනවිටත් ඔසුසැල ආරම්භ කර නොතිබුණි.

(ඉ) හොරණ මූලික රෝහල මගින් 2017 පෙබරවාරි මස ලබාගත් රු.3,303,403 ක් වටිනා උපකරණ භාවිතා කර නොතිබූ අතර රු.943,800 ක් වටිනා උපකරණ මුළුතැන්ගෙය සඳහා අවශ්‍ය නොවන උපකරණ විය.

**6.6 හඳුනාගන්නා ලද පාඩු**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) කළුතර දිස්ත්‍රික්කයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල සඳහා 2017 වර්ෂයේදී රු.54,750,440 ක් වටිනා විදුලිජනන යන්ත්‍ර 28 ක් මිලදීගැනීමේදී එයින් යන්ත්‍ර 23 ක් සඳහා වැඩිපුර ගෙවූ මුදල රු.2,567,440 ක් විය.

(ආ) ගම්පහ දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට අයත් වාහන 06 ක අනතුරු සම්බන්ධයෙන් අයවිය යුතු රු.240,525 ක පාඩු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) කළුතර දිස්ත්‍රික්කයේ රෝහල් 17 ක කිළිටි රෙදි සේදීම සඳහා කොන්ත්‍රාත්කරුවන් 06 දෙනෙකුට ලබාදී තිබූ අතර අවම මිලට වඩා වැඩි වටිනාකමකට කොන්ත්‍රාත්තු පිරිනැමීම නිසා රු.1,668,480 ක පාඩුවක් සිදුව තිබුණි.

## 6.7 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) මතුගම කලාපයේ පාසැල් 03 ක රු.11,856,178 ක වටිනාකමින් යුත් ගොඩනැගිලි ඉදිකිරීම් ආරම්භ කර වර්ෂ කිහිපයක් ගතවී තිබුණද 2018 අගෝස්තු වනවිටත් වැඩ අවසන් කර නොතිබුණි.

(ආ) නැබඩ රෝහලේ මුළුතැන්ගෙය හා විවේක කාමරයක් ඉදිකිරීම වෙනුවෙන් රු.7,589,084 ක් 2017 වර්ෂයේදී වැයකර තිබූ නමුත් ගොඩනැගිල්ලේ බිත්ති පිපිරීම හා වහලෙන් වතුර කාන්දුවීම් පැවතුණි.

## 6.8 ප්‍රමාද වූ ව්‍යාපෘති

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේදී රු.9,345,000 ක්වූ ව්‍යාපෘති 12 ක් එකම ග්‍රාම සංවර්ධන සමිතියකට ප්‍රදානය කිරීමට මාර්ග අමාත්‍යාංශය කටයුතු කර තිබුණි. එම ව්‍යාපෘති 12 නිම කිරීමේ දැඩි කාල පමාවක් නිරීක්ෂණය වූ අතර ව්‍යාපෘති අනුමත කළ දිනයේ සිට මාස 04 සිට මාස 08 දක්වා කාල පමාවකින් පසුව ව්‍යාපෘතිවල වැඩ ආරම්භ කර තිබුණි.

(ආ) නිට්ටඹුව සංඝබෝධි මහා විද්‍යාලයේ තෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා 2014 වර්ෂයේදී අත්තිවාරම් යොදා ස්ලැබ් මට්ටම දක්වා කොන්ක්‍රීට් කණු සකස් කර තිබුණද ඉදිකිරීම් අවසන් නොකිරීම නිසා මේ වනවිට ගොඩනැගිලි සැකිල්ල දිරා පත් වෙමින් පැවතුණි.

## 6.9 විධිමත් පරිදි පවරා නොගත් ඉඩම් / දේපළවල ව්‍යාපෘති ආරම්භ කිරීම

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ප්‍රදේශයේ ප්‍රභූ දානපතියන් තිදෙනෙකුගේ පරිත්‍යාගයක් ලෙස ලැබී 1947 වර්ෂයේ රෝගී සත්කාරක සේවාව ආරම්භ කර වර්ෂ 70 ක් ඉක්ම ගොස් තිබූ මීරිගම මූලික රෝහලේ ඉඩම සඳහා ඔප්පුවක් රෝහල සතුව නොතිබුණි.

(ආ) කිරිබත්ගොඩ මූලික රෝහල 1948 වර්ෂයේ රෝගී සත්කාරක සේවා ආරම්භ කර වර්ෂ 70 කට ආසන්න වෙමින් පවතින අතර ප්‍රදේශයේ ප්‍රභූ දානපති පරිත්‍යාගයක් වූ මෙම රෝහල් භූමිය මූලික සැලසුම්වලට අනුව හෙක්ටයාර 2.1437 ක විශාලත්වයකින් යුක්ත විය. මෙම භූමිය සම්බන්ධයෙන් විධිමත් පැවරුම් ඔප්පුවක් රෝහල සතු නොවීය.

(ඇ) ගම්පහ අධ්‍යාපන කලාපයේ පාසල් 16 ක ඉඩම් පවරාගෙන නොතිබීම, පාසල් 16 ක පවරාගැනීම් පිළිබඳ තොරතුරු නොතිබීම, පාසල් 02 ක පවරා ගැනීමේ කටයුතු අවසන් කර නොමැතිවීම, හා විධිමත් ලෙස පවරාගෙන ඇති බව සඳහන් කර ඇති පාසල් 106 ක ලිඛිත සාක්ෂි ඉදිරිපත් කර නොතිබීම යන අඩුපාඩු පැවතුණි.

(ඈ) ගම්පහ අධ්‍යාපන කලාපය සතු පාසල් අතරින් විධිමත් ලෙස ඉඩම් පවරා නොගත් එහෙත් ඉඩම මැන පිඹුරුපත් සකසා ඇති පාසල් 11 ක්, විධිමත් ලෙස පවරා ගෙන තිබුණද ඉඩම් මැන නොතිබුණු පාසල් 43 ක්, පවරා ගැනීම හා ඉඩම් මැන නැති පාසල් 13 ක්, පාසල් ඉඩමේ කොටසක් පමණක් මැන ඇති පාසල් 4 ක් හා පාසල් ඉඩම මැන ඇති බවට තොරතුරු නොමැති පාසල් 19 ක් තිබූ බව පාසල්වලින් ලබාගත් තොරතුරු අනුව අනාවරණය විය.

(ඉ) මීගමුව අධ්‍යාපන කලාපයේ පාසල් 33 ක් සතු ඉඩම් විධිමත් ලෙස පවරාගෙන ඇති බවට තොරතුරු නොතිබූ අතර පාසල් 50 ක් සතු ඉඩම් විධිමත් ලෙස පවරාගෙන ඇති බව සඳහන් කර තිබුණද සනාථ කළ හැකි සාක්ෂි නොතිබුණි.

## 6.10 වෙනත් රාජ්‍ය ආයතනවලට ලබාදුන් සම්පත් / බාහිර පුද්ගලයන්ට අයත් සම්පත්

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් අක්කර 1 රූඩ් 03 පර්චස් 33 ක භූමිය 1974 ජනවාරි 01 දින සිට අවුරුදු 30 ක කාලයකට බදු දී තිබී බදු කාලය අවසන්ව තිබුණද, බදු ගිවිසුමකින් තොරව ඉහළ මඩම්පැල්ල පේෂ කාර්මිකයින්ගේ සමූපකාර සමිතිය ඉඩම බුක්ති විඳිමින් පැවතුණි.

(ආ) බියගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ඉඩමකින් පර්චස් 6.1 ක වර්ෂ 50 ක පමණ කාලයක සිට සියඹලාපේවත්ත විවිධ සේවා සමූපකාර සමිතිය පවත්වාගෙන යමින් තිබුණද, ඒ සඳහා නීත්‍යානුකූල බලය පැවරීමක් ප්‍රාදේශීය ලේකම්වරයා විසින් සිදුකර නොතිබුණි.

## 6.11 කාර්ය මණ්ඩල පරිපාලනය

2017 දෙසැම්බර් 31 දිනට පළාත් සභාවේ අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

**6.11.1 පළාත් සභා අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතන කාර්ය මණ්ඩලය (සෞඛ්‍ය හා අධ්‍යාපන හැර)**

| | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | | පුරප්පාඩු සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | | ස්ථිර | අනියම්/ආදේශක/ කොන්ත්‍රාත්/තාවකාලික | |
| ජ්‍යෙෂ්ඨ | 963 | 691 | 25 | 272 |
| තෘතීය | 424 | 285 | 04 | 139 |
| ද්විතීය | 4,424 | 3,695 | 17 | 729 |
| ප්‍රාථමික | 1,678 | 1,476 | 04 | 202 |
| කොන්ත්‍රාත් | 16 | - | 04 | 12 |
| තාවකාලික | 14 | - | 11 | 03 |
| එකතුව | 7,519 | 6,147 | 65 | 1,357 |

**6.11.2 පාසැල් කාර්ය මණ්ඩලය**

| | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සේවක සංඛ්‍යාව |
|---|---|---|---|
| විදුහල්පතිවරු | 2,411 | 1,837 | 574 |
| ගුරුභවතුන් | 35,147 | 34,254 | 893 |
| සුළු සේවක හා සහාය කාර්ය මණ්ඩලය | 4,487 | 3,435 | 1,052 |
| එකතුව | 42,045 | 39,526 | 2,519 |

(අ) මීගමුව අධ්‍යාපන කලාපයේ විශේෂ අධ්‍යාපන ළමා සම්පත් සංවර්ධන ඒකකය සඳහා ශිෂ්‍ය අනුපාතයට අනුව ගුරු භවතුන් ප්‍රමාණවත් නොවීය. අධ්‍යාපන ඒකක 18 කට අදාළව සිසුන් 176 ක් සඳහා ගුරු භවතුන් 40 දෙනෙකු සිටිය යුතු වුවත් 2018 ජනවාරි වන විට ගුරුභවතුන් 21 දෙනෙකු පමණක් සේවයේ යෙදී සිටියහ.

(ආ) හොරණ අධ්‍යාපන කලාපයේ පාසල්වල කාර්ය මණ්ඩල තනතුරු අනුමත කරගැනීමකින් තොරව සේවකයින් 159 දෙනෙකු බඳවාගෙන වර්ෂ ගණනාවක සිට වැටුප් ගෙවා තිබුණි.

(ඇ) හොරණ අධ්‍යාපන කලාපයට අදාලව නියෝජ්‍ය විදුහල්පති තනතුරු 03 ක් හා සහකාර විදුහල්පති තනතුරු 24 ක් අතිරික්තව පැවතුණි.

### 6.11.3 සෞඛ්‍ය කාර්ය මණ්ඩලය

| | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | | පුරප්පාඩු සේවක සංඛ්‍යාව | අතිරික්ත සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| | | ස්ථිර | අනියම්/ආදේශක/ කොන්ත්‍රාත්/තාවකාලික | | |
| වෛද්‍ය | 2,049 | 2,079 | - | - | 30 |
| හෙද හෙදි | 3,266 | 3,145 | 10 | 121 | - |
| සහාය කාර්ය මණ්ඩලය | 4,256 | 3,227 | 51 | 1,029 | - |
| සුළු සේවක | 3,511 | 3,220 | 78 | 291 | - |
| එකතුව | 13,082 | 11,671 | 139 | 1,441 | 30 |

හොරණ මූලික රෝහලේ තනතුරු 21 ක නිලධාරීන් 80 ක පුරප්පාඩු හා තනතුරු 06 ක නිලධාරීන් 17 කගේ අතිරික්තයක් පැවතුණි.

### 6.11.4 පළාත් පාලන ආයතන කාර්ය මණ්ඩලය

| | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | | පුරප්පාඩු සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | | ස්ථිර | අනියම්/ආදේශක/ කොන්ත්‍රාත්/තාවකාලික | |
| ජ්‍යෙෂ්ඨ | 568 | 386 | 36 | 182 |
| තෘතීය | 243 | 127 | 03 | 116 |
| ද්විතීය | 6,153 | 4,612 | 41 | 1,541 |
| ප්‍රාථමික | 14,457 | 11,930 | 982 | 2,527 |
| කොන්ත්‍රාත් | 22 | - | 12 | 10 |
| එකතුව | 21,443 | 17,055 | 1,074 | 4,376 |

### 6.11.5 ප්‍රඥප්ති මගින් පිහිටවූ ආයතන කාර්ය මණ්ඩලය

| | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | | පුරප්පාඩු සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | | ස්ථිර | අනියම්/ආදේශක/ කොන්ත්‍රාත්/තාවකාලික | |
| ජ්‍යෙෂ්ඨ | 76 | 60 | 02 | 16 |
| තෘතීය | 99 | 82 | 03 | 17 |
| ද්විතීය | 495 | 412 | 27 | 83 |
| ප්‍රාථමික | 641 | 623 | 07 | 18 |
| කොන්ත්‍රාත් | 02 | - | 01 | 01 |
| එකතුව | 1,313 | 1,177 | 40 | 135 |

**6.12 පළාත් පාලන බලමණ්ඩල කටයුතු අධීක්ෂණය**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනයේ නව වන උපලේඛනයේ 4.2 වගන්තියේ විධිවිධාන අනුව පළාත් පාලන ආයතනයන්ගේ අධීක්ෂණය පළාත් සභාව වෙත පැවරී තිබුණද, පළාත් පාලන බල මණ්ඩල අධීක්ෂණය සඳහා විධිමත් වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබූ අතර, පළාත් පාලන බල මණ්ඩල ගිණුම් විගණනයේදී අනාවරණය වී ඇති කරුණු පළාත් පාලන බල මණ්ඩල ප්‍රධානීන්ගේ අවධානයට යොමුකර තිබුණි. තවද, පළාත් පාලන බල මණ්ඩල ගිණුම් පිළිබඳ විගණකාධිපතිවරයා විසින් විගණන මතය ව්‍යාචනය කර ඇති හා අහිතකර මතයක් ප්‍රකාශ කර ඇති අවස්ථා පිළිබඳ සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක තොරතුරු පහත දැක්වේ.

| වර්ෂය | විගණනය කළ පළාත් පාලන බල මණ්ඩල (මූල්‍ය ප්‍රකාශන) සංඛ්‍යාව | විගණන මතය ව්‍යාචනය කළ පළාත් පාලන බල මණ්ඩල (මූල්‍ය ප්‍රකාශන) සංඛ්‍යාව | අහිතකර මතයක් ප්‍රකාශ කළ පළාත් පාලන බල මණ්ඩල (මූල්‍ය ප්‍රකාශන) සංඛ්‍යාව |
|---|---|---|---|
| 2013 | 48 | 04 | 25 |
| 2014 | 48 | 06 | 02 |
| 2015 | 48 | 03 | 01 |
| 2016 | 48 | - | 02 |
| 2017 | 48 | 01 | - |

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කර තිබූ තොරතුරු අනුව බස්නාහිර පළාතේ පිහිටි පළාත් පාලන බල මණ්ඩල 48 හි හිඟ ආදායම රු.8,410,180,536 ක් විය.

(ඇ) පළාත් පාලන බල මණ්ඩල 06 ක නිලධාරීන්ට / වෙනත් අයවලුන්ට එරෙහිව විගණකාධිපතිවරයා විසින් පනවන ලද අධිභාර 21 කට අදාලව 2017 දෙසැම්බර් 31 දිනට අයකර ගැනීමට තිබූ අධිභාරවල වටිනාකම රු.31,794,735 ක් විය.

(ඈ) පළාත් පාලන බලමණ්ඩලවල පවත්නා අඩුපාඩු පිළිබඳව 2018 ජූලි 31 දින දක්වා නිකුත් කළ විගණන විමසුම්වලින් පළාත් පාලන ආයතන 12 කට නිකුත් කර තිබූ විගණන විමසුම් 75 කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.

## 07. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 7.1 නොවිසඳී ඇති විගණන ඡේද

විෂයය අංක 10903 මුදල්, මුද්දර හා එවන් මූල්‍යමය වටිනාකමක් ඇති ඒවා නැතිවීම් ගිණුම්ගත කිරීම සඳහා අත්තිකාරම් ගිණුම් යටතේ 2014 වර්ෂයේ මහර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ලබාදී තිබූ රු.915,786 ක අත්තිකාරම සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම නිරවුල්වී නොතිබුණි.

### 7.2 වාර්ෂික වාර්තා සභාගත කිරීම

1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(2) වගන්තියේ විධිවිධාන පරිදි පසුගිය වර්ෂයන්හි බස්නාහිර පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපතිවරයාගේ වාර්තා පළාත් සභාව ඉදිරියේ තැබීමේ තත්ත්වය පහත දැක්වේ.

| වර්ෂය | වාර්තාව නිකුත් කළ දිනය | සභාගත කළ දිනය |
|---|---|---|
| 2012 | 2014 අගෝස්තු 27 | 2015 ජනවාරි 20 |
| 2013 | 2014 දෙසැම්බර් 31 | 2015 ජුනි 13 |
| 2014 | 2015 සැප්තැම්බර් 18 | 2016 මැයි 03 |
| 2015 | 2016 අගෝස්තු 16 | 2017 පෙබරවාරි 07 |
| 2016 | 2017 නොවැම්බර් 01 | 2018 පෙබරවාරි 19 |

### 7.3 පාරිසරික හා සමාජ වගකීම් ඉටුකිරීම

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ගම්පහ සුපරීක්ෂණ මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ කාර්තු වාර්තා අනුව 2016 වර්ෂය අවසානයේ ගම්පහ දිස්ත්‍රික්කයේ ලියාපදිංචි නිවාස 27,925 කින් කිසිම වැසිකිළියක් නොමැති නිවාස 260 ක්වූ අතර, සනීපාරක්ෂක නොවන වැසිකිළි සහිත නිවාස 417 ක් විය. මෙම නිවාස ඒකක වඩාත් සතුටුදායක සෞඛ්‍යමය නිවාස බවට පත්කිරීම සඳහා ගැනීමට අපේක්ෂිත ක්‍රියාමාර්ග දක්වා නොතිබුණි.

(ආ) ගම්පහ දිස්ත්‍රික්කයේ ලියාපදිංචි කළ නිවාස 27,925 කින් නිවාස 2,733 ක අනාරක්ෂිත තත්ත්වයේ ළිං පැවතුණි.

(ඇ) ගම්පහ දිස්ත්‍රික්කයේ ආහාර සුරක්ෂිතතාවය සහ ස්වස්ථතාවය යටතේ ලියාපදිංචි කළ බේකරි 29 කින් 4 ක්, ලියාපදිංචි කළ හෝටල් / භෝජනශාලා 65 කින් 3 ක්, ලියාපදිංචි කළ තේ සහ කෝපි කඩ 98 කින් 10 ක් හා සිල්ලර වෙළඳ ස්ථාන 183 කින් 6 ක් අසතුටුදායක තත්ත්වයේ පැවතුණි.

(ඇ) සුපරීක්ෂණ මහජන සෞඛ්‍ය පරීක්ෂක වාර්තාව අනුව මීරිගම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල බල ප්‍රදේශය තුළ පවතින ප්‍රමාණවත් ජල පහසුකම් නොමැති පාසැල් ගණන 6 ක් හා ප්‍රමාණවත් වැසිකිළි පහසුකම් නොමැති පාසැල් ගණන 6 ක් වුවද මේ පිළිබඳව අදාල අධ්‍යාපන බලධාරීන් දැනුවත්වීමක් සිදුව නොතිබුණි.

## 08. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුව ඇත.

| | පද්ධතිය | අඩුපාඩුව |
|---|---|---|
| (අ) | ආදායම් කළමනාකරණය | පුනරාවර්තන ආදායම් හා හිඟ ආදායම් එකතු කිරීමේ දූර්වලතා පැවතීම. |
| (ආ) | පළාත් පාලන බල මණ්ඩල අධීක්ෂණය | හිඟ ආදායම් හා අය නොවන අධිභාර පැවතීම. |
| (ඇ) | සේවක මණ්ඩල කළමනාකරණය | අධ්‍යාපන හා සෞඛ්‍ය කාර්යය මණ්ඩලවල පුරප්පාඩු පැවතීම. |
| (ඈ) | වත්කම් පාලනය | (i) පාසල්වල අඩක් නිම කළ ගොඩනැගිලි හා ප්‍රයෝජනයට නොගන්නා උපකරණ පැවතීම.<br>(ii) රෝහල් හා සෞඛ්‍ය වෛද්‍ය කාර්යාලවල කල්ඉකුත්වූ ඖෂධ හා ප්‍රයෝජනයට නොගන්නා උපකරණ පැවතීම. |